# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

අංක 14,480 — 1965 අගෝස්තු 13 වැනි සිකුරාද — 1965.8.13

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදි)


# III වැනි කොටස—ඉඩම්

(වෙන වෙනම ගොනුකරගත හැකි පරිදි සෑම කොටසකටම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)


| | පිට |
|---|---|
| **ඉඩම් නිරවුල් කිරීම පිළිබඳ දැන්වීම් :—** | |
| ප්‍රාරම්භක දැන්වීම් ... ... ... | — |
| අවසාන නියෝග ... ... ... | — |
| **ආණ්ඩුවේ ඒජන්තවරුන් විසින් ඉඩම් විකිණීම :—** | |
| බස්නාහිර පළාත ... ... ... | — |
| මධ්‍යම පළාත ... ... ... | — |
| දකුණු පළාත ... ... ... | — |
| උතුරු පළාත ... ... ... | — |
| නැගෙනහිර පළාත ... ... ... | — |
| වයඹ පළාත ... ... ... | — |
| උතුරු මැද පළාත ... ... ... | — |
| ඌව පළාත ... ... ... | — |
| සබරගමු පළාත ... ... ... | — |
| **ඉඩම් නිරවුල් කිරීමේ නිලධාරීන් විසින් ඉඩම් විකිණීම :—** | |
| බස්නාහිර පළාත ... ... ... | — |
| මධ්‍යම පළාත ... ... ... | — |
| දකුණු පළාත ... ... ... | — |
| උතුරු පළාත ... ... ... | — |
| නැගෙනහිර පළාත ... ... ... | — |
| වයඹ පළාත ... ... ... | — |
| උතුරු මැද පළාත ... ... ... | — |
| ඌව පළාත ... ... ... | — |
| සබරගමු පළාත ... ... ... | — |
| ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම් ... ... | 433 |
| ඉඩම් සංවර්ධන ආඥාපනත යටතේ දැන්වීම් ... ... | — |
| ඉඩම් නිදහස් කිරීම පිළිබඳ දැන්වීම් ... ... | — |
| ඉඩම් පිළිබඳ විවිධ දැන්වීම් ... ... ... | 441 |
| ඉඩම් හිමි ගැමි ක්‍රමය යටතේ ඉඩම් දීම ... | — |


## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

### 1934 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)

**5 වැනි වගන්තිය යටතේ ප්‍රකාශය**

මෙහි පහත විස්තර කරනු ලැබූ ඉඩම් පොදුජන කටයුත්තක් සඳහා අවශ්‍ය බවත්, එය 1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනතේ විධිවිධාන යටතේ අත්කරගනු ලබන බවත්, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 5 වැනි වගන්තියේ (1) උප වගන්තිය යටතේ ඉඩම්, වාරිමාර්ග හා විදුලිබල ඇමති චාර්ල්ස් පර්සිවල් ද සිල්වා වන මම මෙයින් ප්‍රකාශ කරමි.

1. පහත සඳහන් අන්දමට මායිම් වී ඇති කොළඹ දිස්ත්‍රික්කයේ (උතුරු අළුත්කුරු කෝරළේ "බී" ප්‍රාදේශීය ආදායම් නිලධාරි කොට්ඨාශයේ හැලකන්දන ගමේ පිහිටි ගොඩකුඹුරු නමැති ඉඩමෙන් ප්‍රමාණයෙන් පර්චස් 19.3ක් පමණ වන කොටස :—

උතුරට : මෙම ඉඩමේ ඉතිරි කොට ;
නැගෙනහිරට : එච්. ඒ. ප්‍රේමචන්ද්‍ර හා තවත් අය හිමිකම් කියන ගොඩකුඹුර ;
දකුණට : කුඩා ඔය ;
බස්නාහිරට : සී. සමරතුංග හිමිකම් කියන ගොඩකුඹුර.

2. පහත සඳහන් අන්දමට මායිම් වී ඇති කොළඹ දිස්ත්‍රික්කයේ උතුරු අළුත්කුරු කෝරළේ "බී" ප්‍රාදේශීය ආදායම් නිලධාරි කොට්ඨාශයේ හැලකන්දන ගමේ පිහිටි ගොඩකුඹුර නමැති ඉඩමෙන් ප්‍රමාණයෙන් පර්චස් 23.5 ක් පමණ වන කොටස :—

උතුරට : මෙම ඉඩමේ ඉතිරි කොටස ;
නැගෙනහිරට : එච්. පී. උගෝරිස් පෙරේරා හා තවත් අය හිමිකම් කියන දෙවරුද්දිලියද්ද ;
දකුණට : කුඩාඔය ;
බස්නාහිරට : බී. ගුණවර්ධන හා තවත් අයෙක් හිමිකම් කියන ගොඩකුඹුර.

3. පහත සඳහන් අන්දමට මායිම් වී ඇති කොළඹ දිස්ත්‍රික්කයේ උතුරු අළුත්කුරු කෝරළේ "බී" ප්‍රාදේශීය ආදායම් නිලධාරි කොට්ඨාශයේ හැලකන්දන ගමේ පිහිටි දෙවරුද්දිපිලියද්ද නමැති ඉඩමෙන් ප්‍රමාණයෙන් පර්චස් 09.2 ක් පමණ වන කොටස :—

උතුරට : මෙම ඉඩමේ ඉතිරි කොටස ;
නැගෙනහිරට : ජී. සමරතුංග හා තවත් අය හිමිකම් කියන කොළඹුන්කුඹුර ;
දකුණට : කුඩා ඔය ;
බස්නාහිරට : එච්. ඒ. ප්‍රේමචන්ද්‍ර හා තවත් අය හිමිකම් කියන දෙවරුද්දිපිලියද්ද.

4. පහත සඳහන් අන්දමට මායිම්වී ඇති කොළඹ දිස්ත්‍රික්කයේ උතුරු අළුත්කුරු කෝරළේ "බී" ප්‍රදේශීය ආදායම් නිලධාරි කොට්ඨාශයේ හැලකන්දන ගමේ පිහිටි කොළඹුන්කුඹුර නමැති ඉඩමෙන් ප්‍රමාණයෙන් පර්චස් 06.3ක් පමණ වන කොටස :—

උතුරට : මෙම ඉඩමේ ඉතිරි කොටස ;
නැගෙනහිරට : විදියවත්ත-ගල්කන්ද ප්‍රසිද්ධ පාර ;
දකුණට : කුඩා ඔය ;
බස්නාහිරට : එච්. පී. අගෝරිස් පෙරේරා හා තවත් අයෙක් හිමිකම් කියන දෙවරුද්දිපිලියද්ද.

5. පහත සඳහන් අන්දමට මායිම් වී ඇති කොළඹ දිස්ත්‍රික්කයේ උතුරු. අළුත්කුරු කෝරළේ "බී" ප්‍රාදේශීය ආදායම් නිලධාරි කොට්ඨාශයේ හෙන්ඩිමහර ගමේ පිහිටි ඇලෝවිට නමැති ඉඩමෙන් ප්‍රමාණයෙන් පර්චස් 17.0 ක් පමණ වන කොටස :—

උතුරට : කුඩා ඔය ;
නැගෙනහිරට : විදියවත්ත-ගල්කන්ද ප්‍රසිද්ධ පාර ;
දකුණට : මෙම ඉඩමේ ඉතිරි කොටස ;
බස්නාහිරට : ඇළ.


433——ආර් 61454—1,650 (65/8)

6. පහත සඳහන් අන්දමට මායිම් වී ඇති කොළඹ දිස්ත්‍රික්කයේ උතුරු අළුත්කුරු කෝරළේ "බී" ප්‍රාදේශීය ආදායම් නිලධාරි කොට්ඨාශයේ හෙන්ඩිමහර ගමේ පිහිටි කණුකැටිය කුඹුර නමැති ඉඩමෙන් ප්‍රමාණයෙන් පර්චස් 26.8 ක් පමණ වන කොටස :—

උතුරට : කුඩා ඔය,
නැගෙනහිරට : කුඩා ඔය හා ඇල,
දකුණට : මෙම ඉඩමේ ඉතිරි කොටස,
බස්නාහිරට : බී. ගුණවර්ධන හා තවත් අයෙක් හිමිකම් කියන කණුකැටියකුඹුර.

7. පහත සඳහන් අන්දමට මායිම් වී ඇති කොළඹ දිස්ත්‍රික්කයේ උතුරු අළුත්කුරු කෝරළේ "බී" ප්‍රාදේශීය ආදායම් නිලධාරි කොටසේ හෙන්ඩිමහර ගමේ පිහිටි කණුකැටිය කුඹුරෙන් පර්චස් 12.5 ක් පමණ වන කැබැල්ල, එයට මායිම් :—

උතුරට : කුඩා ඔය ;
නැගෙනහිරට : එච්. ඒ. පියසේන හා තවත් අයෙක් හිමිකම් කියන කණුකැටිය කුඹුර ;
දකුණට : මෙම ඉඩමේ ඉතිරි කොටස ;
බස්නාහිරට : මෙම ඉඩමේ ඉතිරි කොටස හා කුඩා ඔය.

සී. පී. ද සිල්වා,
ඉඩම්, වාරිමාර්ග හා විදුලිබල ඇමති.

යොමු අංක : ජේ. 62/63 එල්. 341—කිව්.බී. 611.
1965 ජූලි 9 වැනි දින, කොළඹ දී ය.

8–263—65.8.13 දින අංක 14,480 දරණ ගැසට් පත්‍රය.

---

## 1964 අංක 28 දරණ ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනතේ (460 වැනි පරිච්ඡේදය)

### 5 වන වගන්තිය යටතේ ප්‍රකාශය

මෙහි පහත විස්තර කරනු ලැබූ ඉඩම් පොදුජන කටයුත්තක් සඳහා අවශ්‍ය බවත්, එය 1964 අංක 28 දරණ ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනතේ විධිවිධාන යටතේ අත්කරගනු ලබන බවත්, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 5 වැනි වගන්තියේ (1) උප වගන්තිය යටතේ, ඉඩම්, වාරිමාර්ග හා විදුලිබල ඇමති චාර්ල්ස් පර්සිවල් ද සිල්වා වන මම මෙයින් ප්‍රකාශ කරමි.

පහත සඳහන් අන්දමට මායිම් වී ඇති, කළුතර දිස්ත්‍රික්කයේ, ගඟබඩ පත්තුව ප්‍රාදේශීය ආදායම් නිලධාරි කොට්ඨාශයේ, ගෝවින්න ග්‍රාම සේවක වසමේ, ගෝවින්න ගමේ පිහිටි සම්පූර්ණ ප්‍රමාණය පර්. 21.7 ක් පමණ වන අමුණුදොල කුඹුර සහ කිරිදිගහ අස්වැද්දුම නැමැති ඉඩම් කොටස් දෙක :—

**1. කිරිදිගහ අස්වැද්දුම (විපි. 1,01,097 කැ. නො. 6,031 න් කොටස) ප්‍රමාණය පර්. 15.9 ක් පමණ.**

උතුරට, නැගෙනහිරට සහ බටහිරට : වේරගොඩගේ ලේයස් සිංඤෝ සහ තවත් අය අයිතිකම් කියන මෙම ඉඩමේම ඉතිරි කොටස ;
දකුණට : තුන්දොල ඇල.

**2. අමුණුදෙල කුඹුර (පි.පි. 3,306 කැ. නො. 5,315 කොටස) ප්‍රමාණය පර්. 11.8 ක් පමණ.**

උතුරට : තුන්දොල ඇල ; නැගෙනහිරට, දකුණට, හා බටහිරට : වෙලගොඩ ලියනගේ නෝරිස් අප්පු හා තවත් අය අයිතිකම් කියන මෙම ඉඩමේම කොටස.

සී. පී. ද සිල්වා,
ඉඩම්, වාරිමාර්ග හා විදුලිබල ඇමති.

යොමු අංක : ජේ. 62/63 එල් 294—ඉඅ/3/28.
1965 ජූලි 9 වැනි දින කොළඹ දී ය.

8–269—65.8.13 දින අංක 14,480 දරණ ගැසට් පත්‍රය.

---

## 1964 අංක 28 දරණ ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනතේ (460 වැනි පරිච්ඡේදය)

### 5 වන වගන්තිය යටතේ ප්‍රකාශය

මෙහි පහත විස්තර කරනු ලැබූ ඉඩම් පොදුජන කටයුත්තක් සඳහා අවශ්‍ය බවත්, එය 1964 අංක 28 දරණ ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනතේ විධිවිධාන යටතේ අත්කරගනු ලබන බවත්, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 5 වැනි වගන්තියේ (1) උප වගන්තිය යටතේ, ඉඩම්, වාරිමාර්ග හා විදුලිබල ඇමති චාර්ල්ස් පර්සිවල් ද සිල්වා වන මම මෙයින් ප්‍රකාශ කරමි.

කළුතර දිස්ත්‍රික්කයේ, නැගෙනහිර පස්දුන් කෝරලයේ, මහපත්තුව ප්‍රාදේශීය ආදායම් නිලධාරි කොටසේ අංක 847 කළුපහන ග්‍රාම සේවක කොටසේ කළුපහන ගමේ පිහිටි නැහින්න වත්ත නොහොත් වලකඩයාවත්ත නමැති ඉඩමෙන් පහත සඳහන් මායිම් තුළ පිහිටි බිම් තීරු දෙක :—

**1. නැහින්න වත්ත නොහොත් වලකඩයාවත්ත (අ.ග.සි. 99 කැ. අංක 122) ප්‍රමාණය අඩි 132 × අඩි 5 පමණ :**

උතුරට : ලොට් 122-නැහින්න වත්ත නොහොත් වලකඩයාවත්ත (පුද්ගලික ඉඩම) ;
දකුණට : ගම්සභා පාර ;
නැගෙනහිරට : ලොට් 122 (නැහින්නවත්ත නොහොත් වලකඩයාවත්ත) ;
බස්නාහිරට : බෝගස් හන්දිය-පරගහතැන්න පාර.

**2. නැහින්නවත්ත නොහොත් වලකඩයාවත්ත (අ.ග.සි.99 කැ. අංක 122) ප්‍රමාණය අඩි 132 × අඩි 5 පමණ :**

උතුරට : ලොට් 122 සහ පරගහතැන්න පාර ;
දකුණට : ගම්සභා පාර ;
නැගෙනහිරට : ලොට් 122 ;
බස්නාහිරට : බෝගස් හන්දිය-පරගහතැන්න පාර.

සී. පී. ද සිල්වා,
ඉඩම්, වාරිමාර්ග හා විදුලිබල ඇමති.

යොමු අංක : ජේ. 64/65 එල්. 10 (වීථි)—ඉඅ/3/135.
1965.7.2 දින, කොළඹ දී ය.

8–273—65.8.6 දින අංක 14,480 දරණ ගැසට් පත්‍රය.

---

## 1964 අංක 28 දරණ ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනතේ (460 වැනි පරිච්ඡේදය)

### 5 වන වගන්තිය යටතේ ප්‍රකාශය

මෙහි පහත විස්තර කරනු ලැබූ ඉඩම් පොදුජන කටයුත්තක් සඳහා අවශ්‍ය බවත්, එය 1964 අංක 28 දරණ ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනතේ විධිවිධාන යටතේ අත්කරගනු ලබන බවත්, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 5 වැනි වගන්තියේ (1) උප වගන්තිය යටතේ, ඉඩම්, වාරිමාර්ග හා විදුලිබල ඇමති චාර්ල්ස් පර්සිවල් ද සිල්වා වන මම මෙයින් ප්‍රකාශ කරමි.

කළුතර දිස්ත්‍රික්කයේ, නැගෙනහිර පස්දුන් කෝරළේ, මහ පත්තුව ප්‍රාදේශීය ආදායම් නිලධාරි කොටසේ, අංක 839 දරණ කිතුල්ගොඩ ග්‍රාම සේවක කොටසේ, කිතුල්ගොඩ ගමේ පිහිටි ලියනගෙවත්ත නමැති ඉඩමෙන් අඩි 231 × 12 ක් පමණ වූ බිම් තීරයට මායිම් මෙසේ යි :—

උතුරට : එම ඉඩමේ ඉතිරි කොටස ;
නැගෙනහිරට : ප්‍රසිද්ධ පාර,
දකුණට : කේ. ඩබ්ලිව්. සිරිසේන නමැති අය අයිතිවාසිකම් කියන ලියනගෙවත්ත ;
බටහිරට : ඩබ්ලිව්. ඒ. කිරිනේරිස් සහ තවත් අය අයිතිවාසිකම් කියන හල්දොලවත්ත.

සී. පී. ද සිල්වා,
ඉඩම්, වාරිමාර්ග හා විදුලිබල ඇමති.

යොමු අංක : ජේ 63/64 එල්. 1271 (වීථි)—ඉඅ/3/132.
1965.7.9 දින, කොළඹ දී ය.

8–270—65.8.13 දින අංක 14,480 දරණ ගැසට් පත්‍රය.

## 1964 අංක 28 දරණ ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනතේ (460 වැනි පරිච්ඡේදය)

### 5 වන වගන්තිය යටතේ ප්‍රකාශය

මෙහි පහත විස්තර කරනු ලැබූ ඉඩම් පොදු ජන කටයුත්තක් සඳහා අවශ්‍ය බවත්, එය 1964 අංක 28 දරණ ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනතේ විධිවිධාන යටතේ අත්කරගනු ලබන බවත්, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 5 වැනි වගන්තියේ (1) උප වගන්තිය යටතේ, ඉඩම්, වාරිමාර්ග හා විදුලිබල ඇමති චාර්ල්ස් පර්සිවල් ද සිල්වා වන මම මෙයින් ප්‍රකාශ කරමි.

කළුතර දිස්ත්‍රික්කයේ, නැගෙනහිර පස්දුන් කෝරළේ ප්‍රාදේශීය ආදායම් නිලධාරි කොටසේ බදුරලිය ග්‍රාම සේවක කොටසේ, කඹුරාවල ගමේ පිහිටි ප්‍රමාණයෙන් අ. 3 ක් පමණ වූ කුරුඳුගස්මානාන සහ අටහවුල් හේන නමැති ඉඩම් කොටස් දෙකට මායිම් :—

**1. කුරුඳුගස් මානාන—ප්‍රමාණය අ. 1, රූ. 3 ක් පමණ :**

උතුරට : කනත්තෙ වත්ත ;

නැගෙනහිරට : පාසැල් පිහිටා ඇති ඉඩම සහ අටහවුල් හේන ;

දකුණට : තිරිමානකැටිය-අගලවත්ත පාර සහ පාසැල් භූමිය ;

බටහිරට : කුරුඳුගස්මානාන සහ කනත්තෙ වත්තෙන් කොටසක්.

**2. අටහවුල් හේනෙන් කොටසක්—ප්‍රමාණය අ. 1, රූ. 1 ක් පමණ :**

උතුරට : අටහවුල්හේනෙන් කොටසක් සහ කනත්තෙවත්තෙන් කොටසක් ;

නැගෙනහිරට : අඩි පාර ;

දකුණට : පාසැල් පිහිටා ඇති ඉඩම, තිරිමානකැටිය-අගලවත්ත පර සහ ගෙයක් සහ වැසිකිළියක් පිහිටි මෙම ඉඩමේ කොටසක් ;

බස්නාහිරට : කුරුඳුගස්මානානෙන් කොටසක්, පාසැල පිහිටා ඇති ඉඩම සහ කනත්තෙ වත්තෙන් කොටසක්.

සී. පී. ද සිල්වා,
ඉඩම්, වාරිමාර්ග හා විදුලිබල ඇමති.

යොමු අංක ජේ 63/64 ඊ. 1057—ඉඅ/3/122.
1965 ජූලි මස 21 දින,
කොළඹ දීය.

8–261—65.8.13 දින අංක 14,480 දරණ ගැසට් පත්‍රය.

---

## 1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)

### 5 වැනි වගන්තිය යටතේ ප්‍රකාශය

මෙහි පහත විස්තර කරනු ලැබූ ඉඩම් පොදු ජන කටයුත්තක් සඳහා අවශ්‍ය බවත්, එය ඉඩම් අත්කර ගැනීමේ පනතේ විධිවිධාන යටතේ අත්කරගනු ලබන බවත්, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 5 වැනි වගන්තියේ (1) උප වගන්තිය යටතේ ඉඩම්, වාරිමාර්ග හා විදුලි බල ඇමති චාර්ල්ස් පර්සිවල් ද සිල්වා වන මම මෙයින් ප්‍රකාශ කරමි.

මහනුවර දිස්ත්‍රික්කයේ උඩ පළාත ප්‍රාදේශීය ආදායම් නිලධාරි කොට්ඨාශයේ කිරින්ද ග්‍රාම සේවක වසමේ උඩෝවිට ගමේ පිහිටා ඇති ගනින්නේදෙමැද්දේහේන, ඇස්සැද්දුමකුඹුර හා ගනින්නේ දෙමැද්දේහේන නමැති ඉඩම් වලින් අක්කර 2¼ක වපසරියකට පහත සඳහන් මායිම් වේ :—

උතුරට : ඒ. බී. ගුණරත්න භුක්ති විඳින බණගේතැන්න හා ආර්. ඇල්. ඉලන්කෝන් භුක්ති විඳින වලව්වේගේනේ ඉම ;

නැගෙනහිරට : එච්. ඇම්. කොසින්මැණිකේ හා තවත් අය භුක්ති විඳින හපුගහගොඩේහේන හා ඒ. බී. ගුණරත්න භුක්ති විඳින බණගේතැන්න ;

දකුණට : රජ ඇල සහ ගම්සභා පාර,

බටහිරට : ආර්. ඇල්. ඉලන්කෝන් භුක්ති විඳින වලව්වේගේනේ ඉම හා යූ. ධර්මපාල හිමි භුක්ති විඳින ගනින්නේදෙමැද්දේ හේන.

**අස්සැද්දමකුඹුර හා ගනින්නේදෙමැද්දේහේන :**

උතුරට : රජ ඇල සහ ගම්සභා පාර ;

නැගෙනහිරට : ගම්සභා පාර, එච්. ඇම්. කිරිබණ්ඩා භුක්ති විඳින ගොඩඇස්සැද්දුමේ වත්ත හා සී. ඇන්. පානබොක්කේ භුක්ති විඳින අලපලාදෙනියේ කුඹුර ;

දකුණට : පී. බී. පානබොක්කේ භුක්ති විඳින වෙලකේදෙනිය කුඹුර හා සී. ඇන්. පානබොක්කේ භුක්ති විඳින අලපලා දෙනිය කුඹුර,

බටහිරට : ඒ. බී. ගුණරත්න භුක්ති විඳින දොඩම්ගහ මඩිත්තේ හේන කුඹුර හා පී. බී. පානබොක්කේ භුක්ති විඳින වෙලකේ දෙනියේ කුඹුර.

සී. පී. ද සිල්වා,
ඉඩම්, වාරිමාර්ග හා විදුලි බල ඇමති.

යොමු අංකය : 63/64 ඊ 826—ඇල්ඩී/ඒ. 229.
1965 ජූලි මස 14 වැනි දින,
කොළඹ දීය.

8–282—65.8.13 දින අංක 14,480 දරණ ගැසට් පත්‍රය.

---

## 1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)

### 5 වැනි වගන්තිය යටතේ ප්‍රකාශය

මෙහි පහත විස්තර කරනු ලැබූ ඉඩම පොදු ජන කටයුත්තක් සඳහා අවශ්‍ය බවත්, එය ඉඩම් අත්කර ගැනීමේ පනතේ විධිවිධාන යටතේ අත්කර ගනු ලබන බවත් 1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනතේ 5 වැනි වගන්තියේ (1) උප වගන්තිය යටතේ ඉඩම්, වාරිමාර්ග හා විදුලිබල ඇමති චාර්ල්ස් පර්සිවල් ද සිල්වා වන මම මෙයින් ප්‍රකාශ කරමි.

මහනුවර දිස්ත්‍රික්කයේ පාත දුම්බර ප්‍රාදේශීය ආදායම් නිලධාරි කොට්ඨාශයේ වත්තේගම ග්‍රාම සේවක වසමේ වත්තේගම පළාත් ආණ්ඩු සභා සීමාවේ කොට්ඨාශ අංක 4 තුළ පිහිටි ප්‍රමාණයෙන් අ. 0, රූඩ් 0, පර්. 15 ක් පමණ වූ ගුණෑම්බිල්වත්ත නොහොත් හාවුන් කෙලිනා ගලගාව හේන නමැති ඉඩමට මායිම් :—

උතුරට : එම ඉඩමේ ඉතිරි කොටස ;

දකුණට : එම ඉඩමේ ඉතිරි කොටස ;

නැගෙනහිරට : එම ඉඩමේ ඉතිරි කොටස ;

බස්නාහිරට : වත්තේගම සිට පන්විල දක්වා යන ප්‍රසිද්ධ පාර.

සී. පී. ද සිල්වා,
ඉඩම්, වාරිමාර්ග හා විදුලිබල ඇමති.

යොමු අංක : ජේ. 64/65 ඇල්ජී. 238—ඇල්ඩී/සී/ඩී 11.
1965 ජූලි මස 21 දින,
කොළඹදීය.

8–279—65.8.13 දින අංක 14,480 දරණ ගැසට් පත්‍රය.

---

## 1964 අංක 28 දරණ ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනතේ (460 වැනි පරිච්ඡේදය)

### 5 වන වගන්තිය යටතේ ප්‍රකාශය

මෙහි පහත විස්තර කරනු ලැබූ ඉඩම පොදුජන කටයුත්තක් සඳහා අවශ්‍ය බවත්, එය 1964 අංක 28 දරණ ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනතේ විධිවිධාන යටතේ අත්කරගනු ලබන බවත්, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 5 වැනි වගන්තියේ (1) උප වගන්තිය යටතේ, ඉඩම්, වාරිමාර්ග හා විදුලිබල ඇමති චාර්ල්ස් පර්සිවල් ද සිල්වා වන මම මෙයින් ප්‍රකාශ කරමි.

පුත්තලම් දිස්ත්‍රික්කයේ කල්පිටිය ප්‍රාදේශීය ආදායම් නිලධාරි කොට්ඨාශයේ මැල් අක්කර පත්තු (විරුතෝඩෙයි) ග්‍රාම සේවක වසමේ විරුතෝඩෙයි (නල්ලන්දළුව) ගමේ පිහිටි වයල්කානි නැමැති කුඹුරු ඉඩමෙන් ප්‍රමාණයෙන් අ. 0, රූ. 1, ප. 37 ක්වූ බිම් කැබැල්ලට මායිම් :—

උතුරට : කේ. ඇම්. කච්චු ඉබ්‍රාහිම් අයිතිකම් කියන කුඹුර හා ඉඩම ; නැගෙනහිරට : පරණ වාන් ඇල සහ විරුතෝඩෙයි වැව් කන්ඩිය ; දකුණට : සපයන ඇල හා වාන් ඇල ; බස්නාහිරට : සපයන ඇල.

සී. පී. ද සිල්වා,
ඉඩම්, වාරිමාර්ග හා විදුලිබල ඇමති.

යොමු අංක : ජේ. 64/65 එල් 137.
1965 ජූලි 9 වැනි දින,
කොළඹ දීය.

8–351—65.8.13 දින අංක 14,480 දරණ ගැසට් පත්‍රය.

## ඉඩම් අත්කරගැනීමේ පනත (460 වෙනි පරිච්ඡේදය)

**වැරදි නිදොස් කිරීම**

යොමු අංකය : ජේ 63/64 ඊ 420. / 2/11/235.

නුවරඑළිය දිස්ත්‍රික්කයේ කොත්මලේ ප්‍රාදේශීය ආදායම් නිලධාරි කොට්ඨාශයේ මාවෙල ග්‍රාමසේවක වසමේ මැදකුඹුර නමැති ඉඩමෙන් අක්කර 1 රූඩ් 2 පමණැති බිම් කොටස සම්බන්ධයෙන් ඉඩම් අත්කර ගැනීමේ පනතේ (460 වෙනි පරිච්ඡේදය) 38 වෙනි වගන්තිය (අ) අතුරු විධානය යටතේ නිකුත් කරනු ලද්දාවූ අංක 14,230 හා 64.10.30 දින දරන ගැසට් පත්‍රයේ ප්‍රසිද්ධ කරනු ලද්දාවූද, 1964 අංක 594 දරන ආඥාවේ උපලේඛනයේ ඉඩම් විස්තරයේ,

"උතුරට : ඩී. ආර්. සී. පාර සහ ගම්සභා පාර,
නැගෙනහිරට : පුස්සැල්ලාව-ගම්පල මහ පාර,
දකුණට : මෙම ඉඩමේම ඉතිරි කොටස,
බටහිරට : ඩී. ආර්. සී. පාර"

යන මායිම.

"උතුරට : මාස්වෙල සිට පුස්සැල්ලාව දක්වා යන ඩී. ආර්. සී. අඩිපාර සහ අඹගහ කුඹුර (කොටසක්),
නැගෙනහිරට : අඹගහ කුඹුර (කොටසක්),
දකුණට : මහබලහපුව නමැති කුඹුරේ ඉඩම,
බස්නාහිරට : හීන්බලහපුව නමැති කුඹුරේ ඉඩම"

යයි

කියවිය යුතු බව සියලු දෙනාගේම දැනගැනීම සඳහා මෙයින් දනුම් දෙමි.

සී. පී. ද සිල්වා,
ඉඩම්, වාරිමාර්ග හා විදුලිබල ඇමති.

8–276—65.8.13 දින අංක 14,480 දරණ ගැසට් පත්‍රය.

---

## ඉඩම් අත්කර ගැනීමේ පණත (460 වැනි පරිච්ඡේදය)

**39 (1) වගන්තිය—පැවරීමේ ආඥාව අවලංගු කිරීම**

යොමු අංකය. ජේ. 59/60 ඊ 389 / එල්. ඩී. ඒ. 106.

ඉඩම් අත්කර ගැනීමේ පනතේ 38 වෙනි වගන්තිය (අ) අතුරු විධානය යටතේ පනවන ලද්දාවූද 1962 ඔක්තෝබර් 12 දින හා 13,344 දරණ ගැසට් පත්‍රයේ පළකරන ලද්දාවූද, 1962 ඔක්තෝබර් 5 වැනි දින හා 1962 අංක 495 දරණ ආඥාවෙන් මෙහි පහත උපලේඛනයේ වඩාත් සවිස්තරව දක්වා ඇති ඉඩම මහරැජින වෙත පැවරී තිබේ.

එනමුත් මේ කියන ලද ඉඩමේ භුක්තිය තවම මහරැජින වෙනුවෙන් භාරගෙන නැත.

එබැවින් ඉඩම්, වාරිමාර්ග හා විදුලිබලය පිළිබඳ ඇමති චාර්ල්ස් පර්සිවල් ද සිල්වා වන මම, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 39 (1) වගන්තිය යටතේ මට පැවරී ඇති බලතල අනුව 1962 ඔක්තෝබර් 12 දින හා අංක 13,344 දරණ රජයේ ගැසට් පත්‍රයේ පළකරන ලද ඉහත සඳහන් 1962 ඔක්තෝබර් 5 වන දින දරණ ආඥාව මෙයින් අවලංගු කරමි.

සී. පී. ද සිල්වා,
ඉඩම්, වාරිමාර්ග හා විදුලිබල ඇමති.

1965 අගෝස්තු මස 4 වැනිදා.
කොළඹ දීය.

### උප ලේඛනය

පහත සඳහන් අන්දමට මායිම් වී ඇති මහනුවර දිස්ත්‍රික්කයේ මහනුවර සහ පාතහේවාහැට ප්‍රාදේශීය ආදායම් කොට්ඨාශයේ ගුරුදෙනිය ගම්මුලාදැනි කොට්ඨාශයේ ගුරුදෙනිය ගමේ පිහිටි ප්‍රමාණය අක්කර 2 ක් පමණ වන කස්තුරිය වත්ත නමැති ඉඩම් කොටස :—

උතුරට : අඩිපාර සහ කෝරලේ ගෙදර කළුබන්ඩා සහ හුංකිරිමුදියන්සේලාගේ පුංචි බණ්ඩා අයිතිකම් කියන අමුනේ ගෙදර වත්ත ; නැගෙනහිරට : මෙම ඉඩමේ ඉතිරි කොටස ; දකුණට : මෙම ඉඩමේ ඉතිරි කොටස සහ සමරනන්දන කේ. ආර්. ඩබ්ලිව්. ඇම්. බිසෝ මැනිකේ සහ තවත් අය අයිතිකම්කියන හාලියාලේ වත්ත ; බස්නාහිරට : මෙම ඉඩමේ ඉතිරි කොටස, සහ පාරක් සඳහා අත්කර ගැනීමට අදහස් කරන මෙම ඉඩමේ කොටසක්.

2. පහත සඳහන් අන්දමට මායිම් වී ඇති මහනුවර දිස්ත්‍රික්කයේ මහනුවර සහ පාතහේවාහැට ප්‍රාදේශීය ආදායම් කොට්ඨාශයේ ගුරුදෙනිය ගම්මුලාදැනි කොට්ඨාශයේ, ගුරුදෙනිය ගමෙහි පිහිටි, ප්‍රමාණය දිගින් අඩි 180 ක් සහ පළලින් අඩි 15 ක් පමණ වන කස්තුරියවත්ත නමැති ඉඩම් කොටස :—

උතුරට : කේ. ජී. කිරිබණ්ඩා, ඒ. ආර්. ඇම්. උක්කුමැණිකා සහ එච්. ඇම් පුංචිබණ්ඩා විසින් අයිතිවාසිකම් කියනු ලබන අමුනේගෙදර වත්ත ; නැගෙනහිරට : මෙම ඉඩමේ ඉතිරි කොටස (අත්කර ගැනීමට අදහස් කරන ඉඩමේ කොටස) ; දකුණට : මෙම ඉඩමේ ඉතිරි කොටස ; බස්නාහිරට : තලාතුඔය-ගුරුදෙනිය ප්‍රසිද්ධ පාර.

8–336—65.8.13 දින අංක 14,480 දරණ ගැසට් පත්‍රය.

---

## ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)

**39 (1) වගන්තිය—පැවරීමේ ආඥාව අවලංගු කිරීම**

යොමු අංකය : ජේ. 61/62 එල්. 398 (වීර්). / එල්එල්/ඒ. 6669.

ඉඩම් අත්කර ගැනීමේ පනතේ 38 වැනි වගන්තිය (අ) අතුරු විධානය යටතේ පනවන ලද්දාවූ ද, 1965 ජනවාරි මස 22 වැනි දින හා අංක 14,297 දරණ රජයේ ගැසට් පත්‍රයේ පළකරන ලද්දාවූ ද, 1965 ජනවාරි මස 7 වැනි දින හා 1965 අංක 9 දරණ ආඥාවෙන් මෙහි පහත උපලේඛනයේ වඩාත් සවිස්තරව දක්වා ඇති ඉඩම මහරැජින වෙත පවරා තිබේ.

එනමුත් මේ කියන ලද ඉඩමේ භුක්තිය තවම මහරැජින වෙනුවෙන් භාරගෙන නැත.

එබැවින් ඉඩම්, වාරිමාර්ග හා විදුලි බලය පිළිබඳ ඇමති චාල්ස් පර්සිවල් ද සිල්වා වන මම ඉඩම් අත්කර ගැනීමේ පනතේ 39 (1) වගන්තිය යටතේ මට පැවරී ඇති බලතල අනුව 1965 ජනවාරි මස 22 වැනි දින හා අංක 14,297 දරණ රජයේ ගැසට් පත්‍රයේ පළකරන ලද ඉහත සඳහන් 1965 ජනවාරි මස 7 දින දරණ ආඥාව මෙයින් අවලංගු කරමි.

සී. පී. ද සිල්වා,
ඉඩම්, වාරිමාර්ග හා විදුලිබල ඇමති.

1965 අගෝස්තු මස 5 වැනි දින,
කොළඹදීය.

### උපලේඛනය

රත්නපුර දිස්ත්‍රික්කයේ, නවදුන් කෝරළයේ, හකමූව වසමේ, හකමූව ගමේ පිහිටි පහත සඳහන් ඒකාබද්ධ ඉඩම් කැබලි දෙක :—

(1) අක්කර 27, රූඩ් 3, පර්චස් 13ක් පමණ වූ පහත සඳහන් මායිම්වලින් යුත් කලුවයිකනත්තහේන, පොතුකොලදෙනියහේන (අ. ග. සි. 18 ලොට් 17 ඒඩී) නමැති ඉඩම :—

උතුරට : ඩබ්ලිව්. සබාති සහ කිරිගතනා සහ තවත් අය විසින් අයිතිවාසිකම් කියනු ලබන කලුවින්කනත්තවත්ත නමැති ඉඩම, (අ. ග. සි. 13 ලොට් 17 බී සහ 17 සී), කේ. කිරිගතනා සහ තවත් අය විසින් අයිතිවාසිකම් කියනු ලබන වටදෙනියලාය ඉහළ වත්ත නමැති ඉඩම (අ. ග. සි. 18 ලොට් 17 ඩී), එච්. පී. කිරිලමයා සහ තවත් අය විසින් අයිතිවාසිකම් කියනු ලබන බදුවත්ත නමැති ඉඩම (අ. ග. සි. 18 ලොට් 17ඒ), ඩී. එච්. ඩබ්ලිව්. තෙන්නකෝන් සහ තවත් අය විසින් අයිතිවාසිකම් කියනු ලබන දෙමටිකැටියෙදෙනිය කුඹුර නමැති ඉඩම (අ. ග. සි. 18 ලොට් 17 ඒfජ්), එච්. ඇම්. පියසිරි සහ තවත් අය විසින් අයිතිවාසිකම් කියනු ලබන තලමණ්ඩියෙහේන නමැති ඉඩම (අ. ග. සි. 18 ලොට් 17 ජී) සහ අ. ග. සි. 18, 3 වැනි අතිරේකයේ ලොට් 49 (ර/හකමූව පාසැල් භූමිය) ;

නැගෙනහිරට : ගල්කොටුවෙල කුඹුර ආදිය (අ. ග. සි. 18 ලොට් 16) ඩී. එච්. ඩබ්ලිව්. තෙන්නකෝන් සහ තවත් අය විසින් අයිතිවාසිකම් කියනු ලබන දෙනියහේන වත්ත නමැති ඉඩම, (අ. ග. සි. 18 ලොට් 17 ඒඊ), එම්. සයිඩින් විසින් අයිතිවාසිකම් කියනු ලබන කලුවකනත්ත වත්ත නොහොත් දෙනියෙහේන (අ. ග. සි. 18 ලොට් 17 එච්), සහ ඉද්දමල් කන්ද ආදී ඉඩම (අ. ග. සි. 18 ලොට් 4) ;

දකුණට : ඩී. එච්. ඩබ්ලිව්. තෙන්නකෝන් සහ තවත් අය විසින් අයිතිවාසිකම් කියනු ලබන පොතුකොළදෙනියෙහේන, මැදබටේහේන සහ පොතුකොළදෙනිය යන ඉඩම් (පිළිවෙලින් අ. ග. සි. 8 ලොට් 17 ඒජී) (17 ඒඅයි සහ 17 අයි) සහ (අ. ග. සි. 18 ලොට් 17 ඒජේ) (අත්පත් කර ගැනීමට යෝජිත) ;

බස්නාහිරට : මුද්දුව ගම් මායිම් (අ. ග. සි. 80).

(2) අක්කර 20, රූඩ් 1, පර්චස් 37ක් පමණ වූ පහත සඳහන් මායිම්වලින් යුත් පොතුකොලදෙනියගේ ත (අ. ග. සි. 18 ලොට් 17 ඒජේ) යන ඉඩම :—

උතුරට: අ. ග. සි. 28 ලොට් 17 ඒඕ (අත්පත් කර ගැනීමට යෝජිත);

නැගෙනහිරට: අ. ග. සි. 18 ලොට් 17 අයි සහ ඕ. එච්. ඔබිලිව්. තෙන්නකෝන් සහ තවත් අය විසින් අයිතිවාසිකම් කියනු ලබන අංඩියදෙනියගොඩැල්ල නමැති ඉඩම (අ. ග. සි. 18 ලොට් 17 එල්);

දකුණට: ඕ. එච්. ඔබිලිව්. තෙන්නකෝන් සහ තවත් අය විසින් අයිතිවාසිකම් කියනු ලබන මැදගොඩදෙනියෙ ගේ තවත්ත, අලියමල ගොඩගේ තවත්ත, දියගලගේ ත සහ උඩුදෙනියෙ කුඹුරු වෙල්යාය (පිළිවෙලින් අ. ග. සි. 18 ලොට් 17 ජේ 17 ඒකේ 17 ඒ.එල් සහ 9) සහ එම්. ජයසිංහ සහ තවත් අය විසින් අයිතිවාසිකම් කියනු ලබන අලියමල ගොඩගේ ත වත්ත (අ. ග. සි. 18 ලොට් 17 කේ);

බස්නාහිරට: ඉද්දෑදු ගම් මාවත (අ. ග. සි. 80).

8–337—65.8.13 දින අංක 14,480 දරණ ගැසට් පත්‍රය.

---

## 1964 අංක 28 දරණ ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)

### 7 වෙනි වගන්තිය යටතේ දැන්වීමයි

යොමු අංකය: කිව්.බී.495

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම ලබා ගැනීමට ආණ්ඩුව අදහස් කරන බැව්, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

ලබාගැනීමට බලාපොරොත්තුවන ඉඩම්වල විස්තර :—

මූලික සිතියමේ අංකය. ඒ. 5094,—කොළඹ දිස්ත්‍රික්කයේ, හ.සිටි ගම් කෝරළය ප්‍රා. ආ. නි. කොට්ඨාසේ, උඩුගහපත්තුවේ තෙන්නගම නමැති ගම.

**කැබැලි අංකය: 1.**

ඉඩමේ නම: කාමරන්ගාව වත්ත; විස්තර: අවුරුදු 20 කට වැඩි වයසැති පොල්, කොස්, කජු, ලුනුමිදෙල්ල, ඉඹුල්, දොඹ, අඹ යනාදි යෙන් යුත් පොල් වත්තක්; හිමිකම්කියනඅය: කොළඹ පදිංචි ඇස්. එච්. ඩයස් අබේසිංහ පෙරකදෝරු තැන, ඇස්. සී. ඕ. ද ලිවේරා පෙරකදෝරු තැන, සහ ඇෆ්. සී. ද සේරම්, පෙරකදෝරු තැන (ඇෆ්. ඒ. ඔබේසේකර (කණිෂ්ඨ) මහතාගේ භාරකරුවන් වශයෙන්); බිම් ප්‍රමාණය: අක්කර 25, රූඩ් 1, පර්. 20.5 යි.

**කැබැලි අංකය: 2.**

ඉඩමේ නම: තවනාලිය වත්ත; විස්තර: අවුරුදු 40 කට වැඩි වයසැති පොල් වැවිල්ලකින් යුත් පොල් වත්තක්; හිමිකම්කියන අය: රජය, කොළඹ පදිංචි, ඇස්. එච්. ඩයස් අබේසිංහ පෙරකදෝරු තැන, ඇස්. සී. ඕ. ද ලිවේරා පෙරකදෝරු තැන, සහ ඇෆ්. සී. ද සේරම්, පෙරකදෝරු තැන (ඇෆ්. ඒ. ඔබේසේකර (කණිෂ්ඨ) මහතා ගේ භාරකරුවන් වශයෙන්) යන අය විසින් බලෙන් අල්ලාගෙන ඇත; බිම් ප්‍රමාණය: අක්කර 0, රූඩ් 0, පර්. 02.5 යි.

**මුළු බිම් ප්‍රමාණය: අක්කර 25, රූඩ් 1, පර්. 22.5 යි.**

ඉහත සඳහන් ඉඩම්වලට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලුදෙනාම තම තමන් හෝ ඔවුන්ගෙන් ලියවිලිවලින් බලය ලත් අයවලුන් හෝ 1965. 9. 21 වැනි දින පූ. භා. 10.30 ට කොළඹ කච්චේරියේ දී මා සම්මුඛ විය යුතුයි.

තවද, 1965 සැප්තැම්බර් මස 13 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම් සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත් එකී ඉඩම් ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත් වන්දි මුදල හා ඒ මුදල ගණන් / බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම්දිය යුතුයි. ඉඩම්වලට තම තමන්ගේ අයිතිය සම්බන්ධයෙන් ඇති ඔප්පු තිරප්පු හා වෙනත් ලිය කියවිලිද මෙම විභාගයේදී මා වෙත ඉදිරිපත් කළ යුතුයි.

අ. පු. බ. මනම්පේරි,
අතිරේක උප දිසාපති,
කොළඹ දිස්ත්‍රික්කය.

1965 අගෝස්තු 3 වැනි දින,
කොළඹ කච්චේරිය.

8–319—65.8.13 දින අංක 14,480 දරණ ගැසට් පත්‍රය.

---

## 1964 අංක 28 දරණ ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධිත) පනතින් සංශෝධිත ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)

### 7 වෙනි වගන්තිය යටතේ දැන්වීමයි

යොමු අංකය: කිව්බී. 532.

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දක්වෙන ඉඩම් ලබා ගැනීමට ආණ්ඩුව අදහස් කරන බැව්, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

ලබාගැනීමට බලාපොරොත්තු වන ඉඩම්වල විස්තර:—

මූලික සැලැස්මේ අංකය: කො. 31—බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, උතුරු අළුත්කුරු කෝරළේ "බී" ප්‍රාදේශීය ආදායම් නිලධාරි කොට්ඨාසේ, දූනගහ පත්තුවේ, පිහිටි දූනගහ සහ හේන්පිටි ගෙදර යන ගම්.

**දූනගහ**

**කැබලි අංකය: 1.**

ඉඩමේ නම: දෙල්ගහලන්ද; විස්තරය: අවුරුදු 40-50ක් වන පොල්ගස් 2ක් ද, අවුරුදු 5-8 වයස උණගස් 33ක් ද, අවුරුදු 2-5 වයස හල්මිල්ල ගස් 5ක් ද, අවුරුදු 10-12 වයස නැදුන්ගස් 6ක් ද, අවුරුදු 2-4 වයස දොඹගස් 2ක් ද, අවුරුදු 3-5 වයස ලුනුමිදෙල්ල ගසක් ද ඇති ඉඩමක්; හිමිකම් කියන්නාගේ නම: රුවන්වැල්ලේ, යටන්විල ආහාර නිෂ්පාදන ඕවර්සියර් තැන්පත් ඇෆ්. එච්. රත්න මහතා; ප්‍රමාණය: අ. 0, රූ. 0, ප. 11.0.

**කැබලි අංකය: 2.**

ඉඩමේ නම: දෙල්ගහලන්ද; විස්තරය: අවුරුදු 40-50 වයසැති පොල්ගස් 2ක් ද, අවුරුදු 20-25 වයසැති කොස්ගසක් ද, අවුරුදු 3-5 වයසැති කජු ගසක්ද, අවුරුදු 15-20 වයසැති පුවක්ගස් 2ක් ද සහිත ඉඩමක්; හිමිකම් කියන්නාගේ නම: රුවන්වැල්ලේ යටන්විල ආහාර නිෂ්පාදන ඕවර්සියර් තැන්පත් ඇෆ්. එච්. සෙනෙවිරත්න මහතා; ප්‍රමාණය: අ. 0, රූ. 0, ප. 11.0.

**කැබැලි අංකය: 3.**

ඉඩමේ නම: දෙල්ගහලන්ද; විස්තරය: අවුරුදු 40-50 වයසැති පොල්ගස් 19ක් ද, අවුරුදු 5-7 වයසැති කජුගසක් ද සහිත පොල් ඉඩමක්; හිමිකම් කියන්නාගේ නම: දූනගහ, දෙල්ගහවත්තේ, පදිංචි වෝල්ටර් සේනානායක මහතා; ප්‍රමාණය: අ. 0, රූ. 0, ප. 22.7.

**එකතුව: අ. 0, රූ. 1, ප. 04.7.**

ඉහත සඳහන් ඉඩම්වලට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලුදෙනාම තම තමන් හෝ ඔවුන්ගෙන් ලියවිලිවලින් බලය ලත් අයවලුන් හෝ 1965.9.21 වැනි දින පූ. භා. 11ට කොළඹ කච්චේරියේදී මා සම්මුඛවිය යුතුයි.

තවද, 1965 සැප්තැම්බර් 13 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම් සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල සවභාවයත් එකී ඉඩම් ලබා ගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත් වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම්දිය යුතුයි. ඉඩම්වලට තම තමන්ගේ ඇති අයිතිය සම්බන්ධව ඇති ඔප්පු තිරප්පු හා වෙනත් ලියකියවිලි ද මෙම විභාගයේදී මා වෙත ඉදිරිපත් කළ යුතුයි.

ඒ. පී. බී. මනම්පේරි,
ආණ්ඩුවේ අතිරේක උප දිසාපති,
කොළඹ දිස්ත්‍රික්කය.

1965 අගෝස්තු 5 වැනි දින,
කොළඹ කච්චේරිය.

8–380—65.8.13 දින අංක 14,480 දරණ ගැසට් පත්‍රය.

සඳහන් අංකය : ඇල් ඩී/බීඩී. 142

## 1964 අංක 28 දරණ ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)

### 7 වෙනි වගන්තිය යටතේ දැන්වීමයි

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම ලබා ගැනීමට ආණ්ඩුව අදහස් කරන බැවි, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

ලබාගැනීමට බලාපොරොත්තු වන ඉඩමේ විස්තර :—

මහනුවර දිස්ත්‍රික්කයේ, උඩපලාත ප්‍රාදේශීය ආදායම් නිලධාරි කොට්ඨාශයේ, කඳුකර පහල කෝරළේ, මැදපිටිය ගමේ පිහිටි, දැනට දොළුවේ, මැදපිටිය ගමේ පදිංචි, දිසානායක මුදියන්සෙලෑ බණ්ඩාර මැණිකේ අයිතිවාසිකම් කියනු ලබන, මූලික සැලැසුම් අංක මහ. 23 හා කැබෙලි අංක 1 වශයෙන් මැන විස්තර කර ඇති ප්‍රමාණයෙන් අක්. 0, රූඩ් 0, පර්. 20 ක් වූ වැලිකැටියගේන නමැති ඉඩම.

ඉහත සඳහන් ඉඩමට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලු දෙනාම තම තමන් හෝ ඔවුන් ගෙන් ලියවිලිවලින් බලය ලත් අයවලුන් හෝ 1965. 10. 15 වැනි දින පූ. භා. 10.30 ට මහනුවර දිසාපති කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතුයි.

තවද, 1965. 10. 7 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල සවභාවයත් එකී ඉඩම ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත් වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම්දිය යුතුයි. තවද එම ඉඩම ගැන ඔවුන්ගේ අයිතිවාසිකම් තහවුරු කර ගැනීම පිණිස සහ එම ඉඩම ගැන ඔවුන් විසින් ඉල්ලනු ලබන වන්දි මුදල් ප්‍රමාණය සම්බන්ධව පවත්වනු ලබන විභාගයේ දී ඉදිරිපත් කළ යුතුයි.

ඇස්. මාරලන්ද,
ආණ්ඩුවේ උප දිසාපති,
මහනුවර දිස්ත්‍රික්කය.

1965 අගෝස්තු මස 5 වැනි දින,
මහනුවර කච්චේරිය.

8–407—65.8.13 දින අංක 14,480 දරණ ගැසට් පත්‍රය.

---

මගේ අංකය : ඇල් ඩී/ඩී 152.

## 1964 අංක 28 දරණ ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)

### 7 වෙනි වගන්තිය යටතේ දැන්වීමයි

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම ලබා ගැනීමට ආණ්ඩුව අදහස් කරන බැවි, 1964 අංක 28 ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

ලබාගැනීමට බලාපොරොත්තු වන ඉඩමේ විස්තර :—

මහනුවර දිස්ත්‍රික්කයේ, හාරිස්පත්තුව ප්‍රාදේශීය ආදායම් නිලධාරි කොට්ඨාශයේ, පල්ලෙගම්පහ කෝරළේ, පලිපාන ගමේ පිහිටි, මූලික සැලසුම් අංක ඒ. 3,182 හා කැබලි අංක 1 වශයෙන් මැන විස්තර කර ඇති දැනට අකුරන බුලු කොහොතැන්නේ පදිංචි කේ. යූ. ඇම්. ෂෙරිපා උම්මා නමැති අය විසින් අයිතිවාසිකම් කියනු ලබන ප්‍රමාණයෙන් අක්. 0, රූඩ් 0, පර්. 07.1 ක් වූ එදිරියගොඩ වත්ත නොහොත් පූජාපිටියවත්ත නමැති ඉඩම.

ඉහත සඳහන් ඉඩමට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලු දෙනාම තම තමන් හෝ ඔවුන් ගෙන් ලියවිලිවලින් බලය ලත් අයවලුන් හෝ 1965. 10. 8 වැනි දින පූ. භා. 10 ට මහනුවර දිසාපති කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතුයි.

තවද, 1965. 10. 1 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල සවභාවයත් එකී ඉඩම ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත් වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම්දිය යුතුයි. තවද එම ඉඩම ගැන ඔවුන්ගේ අයිතිවාසිකම් තහවුරු කර ගැනීම පිණිස සහ එම ඉඩම ගැන ඔවුන් විසින් ඉල්ලනු ලබන වන්දි මුදල් ප්‍රමාණය සම්බන්ධ පවත්වනු ලබන විභාගයේ දී ඉදිරිපත් කළ යුතුයි.

ඇස්. මාරලන්ද,
ආණ්ඩුවේ උප දිසාපති,
මහනුවර දිස්ත්‍රික්කය.

1965 අගෝස්තු මස 5 වැනි දින,
මහනුවර කච්චේරිය.

8–405—65.8.13 දින අංක 14,480 දරණ ගැසට් පත්‍රය.

---

මගේ අංකය : ඇල් ඩී/ඩී 137.

## 1964 අංක 28 දරණ ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)

### 7 වෙනි වගන්තිය යටතේ දැන්වීමයි

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම ලබා ගැනීමට ආණ්ඩුව අදහස් කරන බැවි, 1964 අංක 28 ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

ලබාගැනීමට බලාපොරොත්තු වන ඉඩමේ විස්තර :—

මහනුවර දිස්ත්‍රික්කයේ, උඩුනුවර හා යටිනුවර ප්‍රාදේශීය ආදායම් නිලධාරි කොට්ඨාශයේ කඳු පළාත කෝරළේ (යටිනුවර) කඩුගන්නාව පළාත් ආණ්ඩු සභා සීමාව තුල, අංක 5 දරණ තම්මන්නාගොඩ කොට්ඨාශයේ, කඩවත්ගම (කොටසක්) ගමේ පිහිටි මූලික සැලසුම් අංක ඒ. 3,159 කැබලි අංක 1 වශයෙන් මැන විස්තර කර ඇති, දැනට කඩුගන්නාවේ, කඳන්ගම පදිංචි සෝමාවතී මාරසිංහ මහත්මිය අයිතිවාසිකම් කියනු ලබන ප්‍රමාණයෙන් අක්කර 0, රූඩ් 0, පර්චස් 01.72 ක් වූ මහනුවර පාරේ වරිපනම් අංක 245/1 කොටසක් වූ නිල්ගමුව කුඹුරේ පිල්ලෑව.

ඉහත සඳහන් ඉඩමට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලු දෙනාම තම තමන් හෝ ඔවුන් ගෙන් ලියවිලිවලින් බලය ලත් අයවලුන් හෝ 1965. 10. 8 වැනි දින පූ. භා. 9.30 ට මහනුවර දිසාපති කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතුයි.

තවද, 1965. 10. 1 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල සවභාවයත් එකී ඉඩම ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත් වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම්දිය යුතුයි. තවද එම ඉඩම ගැන ඔවුන්ගේ අයිතිවාසිකම් තහවුරු කර ගැනීම පිණිස සහ එම ඉඩම ගැන ඔවුන් විසින් ඉල්ලනු ලබන වන්දි මුදල් ප්‍රමාණය සම්බන්ධ පවත්වනු ලබන විභාගයේ දී ඉදිරිපත් කළ යුතුයි.

ඇස්. මාරලන්ද,
ආණ්ඩුවේ උප දිසාපති,
මහනුවර දිස්ත්‍රික්කය.

1965 අගෝස්තු මස 5 වැනි දින,
මහනුවර කච්චේරිය.

8–406—65.8.13 දින අංක 14,480 දරණ ගැසට් පත්‍රය.

සඳහන් අංකය: ඇල්ඞී/බීඞී. 132

## 1964 අංක 28 දරණ ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)

### 7 වෙනි වගන්තිය යටතේ දැන්වීමයි

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දක්වෙන ඉඩම ලබා ගැනීමට ආණ්ඩුව අදහස් කරන බැවි, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

ලබාගැනීමට බලාපොරොත්තු වන ඉඩමේ විස්තර:—

මහනුවර දිස්ත්‍රික්කයේ, උඩබුලත්ගම ප්‍රාදේශීය ආදායම් නිලධාරී කොට්ඨාශයේ, පස්බාගේ කෝරළේ, පල්ලේගම ගමේ පිහිටි, මුලික සැලසුම් අංක මහ 39 හා කැබෙලි අංක 1 වශයෙන් මැන විස්තර කර ඇති, දැනට උලපනේ, නාවලපිටිය පාරේ, අංක 116 දරන ස්ථානයේ පදිංචි, ඕ. ඇල්. ඇම්. හනීපා අයිතිකම් කියනු ලබන, ප්‍රමාණයෙන් අක්. 0, රූඩ් 0, පර්. 35.6 ක් වූ ගුරුලැල නමැති ඉඩම.

ඉහත සඳහන් ඉඩමට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලු දෙනාම තම තමන් හෝ ඔවුන් ගෙන් ලියවිලිවලින් බලය ලත් අයවලුන් හෝ 1965. 10. 15 වැනි දින පූ. භා. 10 ට මහනුවර දිසාපති කායාීලයේ දී මා සම්මුඛ විය යුතුයි.

තවද, 1965. 10. 7 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල සවභාවයත් එකී ඉඩම ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත් වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම්දිය යුතුයි. තවද එම ඉඩම ගැන ඔවුන්ගේ අයිතිවාසිකම් තහවුරු කර ගැනීම පිණිස සහ එම ඉඩම ගැන ඔවුන් විසින් ඉල්ලනු ලබන වන්දි මුදල් ප්‍රමාණය සම්බන්ධ පවත්වනු ලබන විභාගයේ දී ඉදිරිපත් කළ යුතුයි.

ඇස්. මාරලන්ද,
ආණ්ඩුවේ උප දිසාපති,
මහනුවර දිස්ත්‍රික්කය.

1965 අගෝස්තු මස 5 වැනි දින,
මහනුවර කච්චේරිය.

8–416—65.8.13 දින අංක 14,480 දරණ ගැසට් පත්‍රය.

---

මගේ අංකය: ඉට/3/197.

## 1964රේ අංක 28 දරණ සංශෝධිත පණතින් සංශෝධනය වූ ඉඩම් අත්පත් කිරීමේ ආඥාපනතේ 33 වැනි වගන්ති යටතේ දැන්වීමයි (460 වැනි පරිච්ඡේදය)

ගාලු දිස්ත්‍රික්කයේ ඉඩම් අත්පත් කිරීමේ නිලධාරි සී. ඒ. ජයසිංහ වන මම විසින් ඉඩම් ලබාගැනීමේ 33 වැනි වගන්තිය යටතේ, පහත සඳහන් උපලේඛනයේ විස්තර කරදී ඇති ඉඩම රජයට ලබාගැනීම සඳහා ගෙවිය යුතු වන්දි මුදලවූ රුපියල් 9,500 අයිතිකරුවන්ට ලබා ගැනීම පිණිස ගාල්ලේ දිස්ත්‍රික් උසාවියේ අංක ඇස්පීඇල්. 2,254 දරණ නඩුවට තැන්පත් කර ඇති බව මෙයින් දැනුම් දෙමි.

සී. ඒ. ජයසිංහ,
ගාලු දිස්ත්‍රික්කයේ ඉඩම් අත්පත් කිරීමේ නිලධාරි.

1965 අගෝස්තු 5 දින,
ගාල්ලේ දිසාපති කායාීලයේදිය.

### උප ලේඛනය

**ඉඩමේ නම:** දෙල්ගහවලහේන;

**පිතියම් අංකය:** 649 දරණ අ. ග. සැලැස්මේ 2 වැනි අතිරේකය.

**කැබැලි අංකය:** 960;

**බිම් ප්‍රමාණය:** අ. 6, රූ. 1, ප. 13.3;

**පිහිටීම:** ගාලු දිස්ත්‍රික්කයේ ග. බ. ප., ප්‍රා. ආ. නි. කොට්ඨාශයේ මැද කිඹිය ග්‍රාම සේවක කොටසේ මැද කිඹිය නමැති ගමේ පිහිටි.

8–345—65.8.13 දින අංක 14,480 දරණ ගැසට් පත්‍රය.

---

යොමු අංකය: ඇල්ඒ/4114/ජේ60/61 ඊ 442.

## ඉඩම් අත්පත්කරගැනීමේ ආඥාපනත (460 වැනි පරිච්ඡේදය)

### 7 වැනි වගන්තිය යටතේ කෙරෙන දැන්වීමයි

පහත සඳහන් ඉඩම පොදු කටයුත්තක් සඳහා අවශ්‍යව ඇති හෙයින්, එය අත්පත්කර ගැනීමට රජය අදහස් කරන බැවි, ඉඩම් අත්පත්කරගැනීමේ ආඥාපණතේ 460 වැනි පරිච්ඡේදයේ 7 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ මෙයින් නිවේදනය කරමි.

අත්පත් කරගනු ලැබීමට ඇති ඉඩමේ විස්තර:—

නැගෙනහිර පලාතේ ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ කින්නියා ප්‍රාදේශීය ආදායම් නිලධාරි කොට්ඨාශයේ සින්නකින්නියා ගමේ පිහිටි, අංක 6 දරණ අවසාන භූලක්ෂණාත්මක සැලැස්මේ, අංක 1 දරණ අතිරේකයේ අංක 6 දරණ අතුරඟි දක්වා ඇති අංක 369 සහ 375 දරණ බිම් කැබැලිවල කොටස්.

**ඉඩමේ නම:** උප්පාරු වත්ත;

**විස්තර:** පොල් ඉඩම;

**විශාලත්වය:** අක්කර 2 යි, රූඩ් 0 යි, පර්චස් 16.6 යි;

**අයිතිවාසිකම් කියන්නාගේ නම:** මැද මහනුවර, ගලේකැලේ වත්තේ, ආර්. ජී. ජොන්ස්ටන් මහතා.

යථෝක්ත ඉඩම පිළිබඳ උනන්දුවක් දක්වන සියළු දෙනාම තම තමන් හෝ තමා වෙනුවෙන් විධිමත් ලෙස ලියවිල්ලකින් බලය පවරනු ලැබූ නියෝජිතයෙකු හෝ 1965 සැප්තැම්බර් මස 27 වැනි දින පෙරවරු 10 ට ත්‍රිකුණාමලය කච්චේරියේදී මා හමුවට පැමිණිය යුතු බවත්, මෙම ඉඩම වෙනුවෙන් තමන් උනන්දු වන්නේ කුමක් නිසාදැයි යන වගත්, එකී ඉඩම අත්පත්කරගැනීම වෙනුවෙන් වන්දි ඉල්වීමේ විස්තරත්, වන්දි වශයෙන් ඉල්ලුම් කරන ගණන හා එය ගිණූ අයුරුත්, පිටපත් දෙකක් සහිතව ලියූ ලිපියක මාර්ගයෙන් 1965 සැප්තැම්බර් මස 20 වැනි දිනට හෝ ඊට ප්‍රථම මා වෙත (කච්චේරි ලිපිනයට) දැනුම් දෙන ලෙස මෙයින් දන්වා සිටිමි.

ඇම්. බී. සේනානායක,
ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ දිසාපති.

1965 අගෝස්තු මස 2 වැනි දින,
ත්‍රිකුණාමලය දිසාපති කාර්යාලයේ දීය.

8–361—65.8.13 දින අංක 14,480 දරණ ගැසට් පත්‍රය.

---

අංකය: 3/61/76—ජේ 62/63 එල් 417.

## 1964 අංක 28 දරණ ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධිත) පනතින් සංශෝධිත ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)

### 7 වෙනි වගන්තිය යටතේ දැන්වීමයි

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දක්වෙන ඉඩම් ලබා ගැනීමට ආණ්ඩුව අදහස් කරන බැවි, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

ලබාගැනීමට බලාපොරොත්තු වන ඉඩම්වල විස්තර:—වයඹ පලාතේ කුරුණෑගල දිස්ත්‍රික්කයේ වැඩවිල්ලි හත්පත්තුවේ, කුඩා ගල්බොඩ කෝරළේ, වෙලගනේ සහ හෙට්ටිගෙදර නමැති ගම්.

අංක ඒ 1,871 දරණ මුලික සැලැස්ම

**කැබලි අංකය:** 1.

**ඉඩමේ නම:** පතගිවත්ත; **විස්තරය:** අවුරුදු 35 පොල්ගස් 14ක් සහිත පොල් ඉඩම; **හිමිකම් දක්වන අය:** තෙල්සන් වික්‍රමාරච්චි මයා., පැල්ලන්දෙණිය, මාස්පොත; **ප්‍රමාණය:** අ. 0, රූ. 0. ප. 35.0.

**කැබලි අංකය : 2.**

ඉඩමේ නම : තාවලකුඹුර ; විස්තරය : කුඹුර ; හිමිකම් දක්වන අය : ඇස්. බී. ඩබ්ලිව්. තිලකරත්න මයා., වැලගනේ, මාස්පොත ; ප්‍රමාණය : අ. 0, රූ. 2, ප. 21.8.

**කැබලි අංකය : 3.**

ඉඩමේ නම : ඇල්ලගොඩයාය ; විස්තරය : අවුරුදු 35 පොල්ගස් 5ක් සහිත පොල් ඉඩම ; හිමිකම් දක්වන අය : ඇස්. බී. ඩබ්ලිව්. තිලකරත්න මයා., වැලගනේ, මාස්පොත ; ප්‍රමාණය : අ. 0, රූ. 0, ප. 10.7.

ඉහත සඳහන් ඉඩම්වලට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලුදෙනාම තම තමන් හෝ ඔවුන්ගෙන් ලියවිලිවලින් බලය ලත් අයවලුන් හෝ 1965.10.6 වැනි දින පූ. භා. 9.30ට කුරුණෑගල කච්චේරියේ දී මා සම්මුඛ විය යුතුයි.

තවද, 1965.9.29 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම් සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල සවභාවයත් එකී ඉඩම් ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත් වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම්දිය යුතුයි.

සැ. යු.—අයිතිවාසිකම් ඔප්පු කිරීමට ඇති සියළුම ලියකියවිලි පරීක්ෂණයේදී ඉදිරිපත් කළ යුතුයි.

ඇල්. බී. උදලාගම,
ආණ්ඩුවේ උප දිසාපති,
කුරුණෑගල දිස්ත්‍රික්කය.

1965 අගෝස්තු මස 5 වැනි දින,
කුරුණෑගල කච්චේරිය.

8-390—65.8.13 දින අංක 14,480 දරණ ගැසට් පත්‍රය.

---

සැදහුම : එල්ඒ/බී/24.

**1964 අංක 28 දරණ ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

**7 වැනි වගන්තිය යටතේ දැන්වීමයි**

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම ලබා ගැනීමට ආණ්ඩුව අදහස් කරන බැවි, 1964 අංක 28 දරණ ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

ලබාගැනීමට බලාපොරොත්තුවන ඉඩමේ විස්තර.—

174 අවසාන ගම් සිතියමට අතිරේක අංක 2, ඌව පළාත, බදුල්ල දිස්ත්‍රික්කය, යටිකිඳ ප්‍රාදේශීය ආදායම් නිලධාරි කොට්ඨාශය, බෝගොඩ කෝරලේ දඹුගලගම.

**කැබලි අංක : 142.**

ඉඩමේ නම : උඩවත්ත ; විස්තරය : අවුරුදු 12 ක් පමණ දෙල්ගස් 1 යි, අවුරුදු 12ක් පමණ කොස් ගස් 1 යි, අවුරුදු 10-12 ක් පමණ පුවක්ගස් 6 ක් සහ අවුරුදු 12 ක් පමණ අලිගැටපේර (බටර් පෑට්) ගස් 1 ක් සහිත ගෙවත්ත ; බිම් ප්‍රමාණය : අ. 0, රූ. 1, පර්. 01.5 යි.

සැ. යු.—මේ සම්බන්ධයෙන් අංක 14,159 හා 64.9.4 දින ගැසට් පත්‍රයේ පළ කරන ලද පණතේ 7 වැනි වගන්තිය යටතේ දැන්වීම මෙයින් අවලංගුකරනු ලැබේ.

ඉහත සඳහන් ඉඩමට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලුදෙනාම තම තමන් හෝ ඔවුන්ගෙන් ලියවිලිවලින් බලය ලත් අයවලුන් හෝ 1965 සැප්තැම්බර් 23 වැනි දින පූ. භා. 10 ට බදුල්ලේ දිසාපති කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතුයි.

තවද, 1965 සැප්තැම්බර් 16 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල සවභාවයත් එකී ඉඩම ලබා ගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත් වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතුයි. ඉඩමේ අයිතිය තහවුරු කිරීම සඳහා අදාල ඔප්පු හා ලියකියවිලි හිමිකම් පිළිබඳ විභාගයේදී ඉදිරිපත් කළ යුතුය.

පූ. බ. තෙන්නකෝන්,
ආණ්ඩුවේ උප දිසාපති,
බදුල්ල දිස්ත්‍රික්කය.

1965 අගෝස්තු 6 වැනි දින,
බදුල්ල කච්චේරිය.

8-384—65.8.13 දින අංක 14,480 දරණ ගැසට් පත්‍රය.

---

මගේ අංකය : එල්එල්/ඒ. 6458

**1964 අංක 28 දරණ ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි, ඉඩම් අත්කර ගැනීමේ ආඥාපනත**

**(12 වැනි කාණ්ඩයේ 460 පරිච්ඡේදය)**

**33 (බී) වගන්තිය යටතේ දැන්වීම**

ඉඩම් අත්පත්කර ගැනීමේ ආඥාපනතේ 33(බී) වැනි වගන්තිය අනුව රත්නපුර දිස්ත්‍රික්කයේ උප දිසාපති වන වික්‍රම රන්බණ්ඩා රාජකරුණා වන මවිසින් දන්වනුයේ මෙහි පහත සඳහන් කර ඇති, වන්දි මුදල් හා එහි පොලියද ඊට අයිතිවාසිකම් ඇති අය විසින් ලබාගන්නා පිණිස රත්නපුර රික්වෙස්ට් උසාවියට ගෙවා ඇති බවයි.

වි. ර. බ. රාජකරුණා.
රත්නපුර උප දිසාපති,

1965 ජූලි මස 28 වැනිද,
රත්නපුර දිසාපති කාර්‍යාලයේදී ය.

උපලේඛනය

| අංක | ඉඩමේ විස්තර | මුදල රු. ශ. | නඩු අංකය |
|---|---|---|---|
| 1 ... | රත්නපුර දිස්ත්‍රික්කයේ කුරුවිට කෝරලේ කැන්දන්ගමුව පහළගම වසමේ තිබ්බොටුවාව ගමේ අංක 673 දරණ ගම් සිතියමේ, 1 වැනි අතිරේකයෙන් මැන වෙන් කරණ ලද අංක 152 දරණ කොටුවේ ලියද්ද නමැති ඉඩමෙන් 1,12 පංගුවක් | 13 33 ... | රත්නපුර රික්වෙස්ට් උසාවියේ අංක 132/යොමු දරණ නඩුව |
| 2 ... | රත්නපුර දිස්ත්‍රික්කයේ කුරුවිට කෝරලේ කැන්දන්ගමුව පහළගම වසමේ යකුදගොඩ ගම්මන්ඩිය ගමේ, අංක 675 දරණ ගම් සිතියමේ, 1 වැනි අතිරේකයෙන් මැන වෙන් කරණ ලද අංක 95½ දරණ, දෙඩම්ගහයට ලියද්ද නමැති ඉඩමෙන් 1,3 පංගුවක් | 13 35 ... | රත්නපුර රික්වෙස්ට් උසාවියේ අංක 133,යොමු දරණ නඩුව |
| 3 ... | රත්නපුර දිස්ත්‍රික්කයේ, කුරුවිට කෝරලේ කැන්දන්ගමුව පහළගම වසමේ, යකුදගොඩ ගම්මන්ඩිය ගමේ, අංක 675 දරණ ගම් සිතියමේ, 1 වැනි අතිරේකයෙන් මැන වෙන් කරණ ලද, අංක 96 දරණ, අස්මාලේ කුඹුර නමැති ඉඩමෙන්, 5,8 පංගුවක් | 109 38 ... | රත්නපුර රික්වෙස්ට් උසාවියේ අංක 134/යොමු දරණ නඩුව |
| 4 ... | රත්නපුර දිස්ත්‍රික්කයේ, කුරුවිටි කෝරලේ කැන්දන්ගමුව පහළගම වසමේ තිබ්බොටුවාව ගමේ, අංක 673 දරණ ගම් සිතියමේ 1 වැනි අතිරේකයෙන් මැන වෙන් කරණ ලද, අංක 151 දරණ, මහකුඹුර නමැති ඉඩමෙන් 211,300 පංගුවක් | 66 84 ... | රත්නපුර රික්වෙස්ට් උසාවියේ අංක 135/යොමු දරණ නඩුව |

| අංක | ඉඩමේ විස්තර | මුදල රු. ශ. | නඩු අංකය |
|---|---|---|---|
| 5 ... | රත්නපුර දිස්ත්‍රික්කයේ, කුරුවිට කෝරලේ කැන්දන්ගමුව පහළගම වසමේ, තිබ්බොටුවාව ගමේ, අංක 673 දරණ ගම් සිතියමේ 1 වැනි අතිරේකයෙන් මැන වෙන් කරණ ලද අංක 152 දරණ කොරටුවෙලියද්ද නමැති ඉඩමෙන් 13/720 පංගුවක් | 122 27 ... | රත්නපුර රික්වෙස්ට් උසාවියේ අංක 136/යොමු දරණ නඩුව |
| 6 ... | රත්නපුර දිස්ත්‍රික්කයේ කුරුවිට කෝරලේ කැන්දන්ගමුව පහළගම වසමේ, යකුදගොඩ ගම්මන්ඩිය ගමේ අංක 673 දරණ ගම් සිතියමේ, 1 වැනි අතිරේකයෙන් මැන වෙන් කරණ ලද අංක 149 දරණ තුඹපිටියෙ කුඹුර නමැති ඉඩම | 75 0 ... | රත්නපුර රික්වෙස්ට් උසාවියේ අංක 137/යොමු දරණ නඩුව |
| 7 ... | රත්නපුර දිස්ත්‍රික්කයේ කුරුවිට කෝරලේ කැන්දන්ගමුව, පහළගම වසමේ, තිබ්බොටුවාව ගමේ, අංක 675 දරණ ගම් සිතියමේ 1 වැනි අතිරේකයෙන් මැන වෙන් කරණ ලද අංක 91½, 92 හා 94 දරණ පල්මුල්ලෙ කුඹුර තුඹපිටිමුල්ල සහ දෙඩම්ගහයට ලියද්ද නමැති ඉඩම්. | 111 0 ... | රත්නපුර රික්වෙස්ට් උසාවියේ අංක 138/යොමු දරණ නඩුව |

8–268—65.8.13 දින අංක 14,480 දරන ගැසට් පත්‍රය.

# ඉඩම් පිළිබඳ විවිධ දැන්වීම්

අංකය : ඉ/බ/1/වෙ/154/ග.

## කළුතර දිස්ත්‍රික්කයේ රජයේ ඉඩම්වල පිහිටි වගාවේ එළදාව භුක්ති විඳීමේ බද්ද වෙන්දේසියේ විකිණීමයි

මෙහි පහත දක්වෙන උපලේඛනයෙහි සඳහන් රජයේ ඉඩමේ ඇති වගාවේ එළදාව 1965 සැප්තැම්බර් මස 1 දින සිට 1966 දෙසැම්බර් මස 31 දින දක්වා භුක්ති විඳීමේ අයිතිය (මින් පසු දිසාපතිතුමා යයි කියැවෙන සියළුම ස්ථානයන්හි කළුතර දිස්ත්‍රික්කයේ දිසාපතිතුමන් හෝ එතුමන් විසින් මෙම බද්ද වෙන්දේසි කිරීම සඳහා බලය පවරනු ලබන නිලධාරි තුමෙකු හෝ ඇතුළත්වන) කළුතර දිස්ත්‍රික්කයේ දිසාපති තුමන් විසින් මෙහි පහත උපලේඛනයේ සඳහන්වන ස්ථානයේදී එහි සඳහන් දින සහ වේලාවේදී ප්‍රසිද්ධ වෙන්දේසියේ බදු දෙනු ලබන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

2. මෙම ඉඩම සඳහා තබන ලද ලංසුව මෙහි පහත සඳහන් උපලේඛනයේ එකී ඉඩම් ඉදිරියේ සඳහන් කර ඇති ලංසුවට අඩුවෙන් කෙරෙන ඉල්ලීම් පිළිගනු නොලැබේ.

3. සෑම ඉල්ලීමක්ම භාර ගැනීමට පෙර, එම ඉල්ලීමේ සත්‍ය භාවය හා එකී ඉල්ලුම්කරුට, බද්දෙහි සඳහන් කරනු ලබන කොන්දේසි පිළිපැදීමට ඇති හැකියාවන් ගැන දිසාපතිතුමන් විසින් සොයා බලනු ඇත. යම් ඉල්ලීමක් එසේ පිළිගත හැකියයි එතුමන් සෑහීමට පත් නොවුවහොත් එවැනි ඉල්ලීමක් නොකරන ලද සේ සලකා බද්ද දිගටම වෙන්දේසි කරනු ඇත.

4. වෙන්දේසිය පවත්වන අවස්ථාවේදී, සෑම ඉල්ලුම්කරුවෙකුම තමන්ම හෝ ලියවිල්ලකින් බලය පවරනු ලැබූ නියෝජිතයෙකු මගින් හෝ පෙනී සිටිය යුතුය. නියෝජිතයෙකු මගින් ඉල්ලීම් කරනු ලබන සෑම අවස්ථාවකදීම, වෙන්දේසියේදී ඉල්ලීම් ඉදිරිපත් කිරීම සඳහා මූලික ඉල්ලුම්කරු විසින් බලය පවරමින් දෙන ලද ලිපි සියළුම නියෝජිතයන් විසින් වෙන්දේසිය පටන් ගැනීමට පෙර දිසාපතිතුමන්ගේ පරීක්ෂාව සඳහා ඉදිරිපත් කළ යුතුය.

5. දිසාපතිතුමන් විසින් පිළිගනු ලබන ඉල්ලීම් ඉදිරිපත් කරන ඉල්ලුම්කරු විසින් එසේ ඉල්ලුම් කරන ලද මිලෙන් හරි අඩක් එම ඉල්ලීම පිළිගනු ලැබූ වහාම, එම ස්ථානයේදී ද, ඉතිරි මුදල, එදින සිට දෙසතියක් ඇතුළතද, දිසාපති තුමන්ට ගෙවිය යුතුය. එම ඉල්ලුම්කරුට ඉඩම භාරදෙනු ලබන්නේ සම්පූර්ණ මුදල ගෙවූ පසුය. යම් හෙයකින් වෙන්දේසිය අවසන්වූ වහාම පිළිගනු ලැබූ ඉල්ලීම ඉදිරිපත් කළ අයට ඉල්ලූ මුදලින් හරි අඩක් හෝ දෙසතියක් තුළ ඉතිරි හිඟ මුදල හෝ ගෙවීමට නොහැකි වුවහොත්, එම වෙන්දේසිය අවලංගු කොට ඉල්ලුම්කරු එතෙක් ගෙවා ඇති සියළුම මුදල් රාජසන්තක කිරීමට රජයට බලය ඇත.

6. දිසාපතිතුමාට අවශ්‍ය යයි හැඟී නියම කළහොත්, පිළිගනු ලැබූ ඉල්ලීම ඉදිරිපත් කළ ඉල්ලුම්කරු විසින් ඇප මුදලක් තැන්පත් කළ යුතුය. මේ මුදල කෙසේවත් ඉල්ලුම් කරන ලද මුදලෙන් සියයට 10 කට වැඩි නොවිය යුතුය.

7. ඉල්ලුම් කරන ලද මුළු මුදල ගෙවූ ඉක්බිති වෙනත් කොන්දේසි සමග පහත සඳහන් කොන්දේසිද ඇතුළත් බලපත්‍රයක් ඉල්ලුම්කරු නමින් නිකුත් කරනු ලැබේ :—

(1) ඕනෑම අවස්ථාවක මාසයක් කල් දෙමින් ලියවිල්ලක් අවසර පත්‍රකරුට පුද්ගලිකව භාර දීමෙන් හෝ ඔහුගේ හෝ ඇයගේ අවසන් වරට ගත් ලිපිනයට ලියා පදිංචිකළ තැපැලෙන් යැවීමෙන් හෝ බදු දෙන ලද ඉඩමේ පැහැදිලිව පෙනෙන ස්ථානයක අලවා තැබීමෙන් හෝ මේ බද්ද එසේ කල් දෙනු ලැබූ මාසය අවසන අවලංගු කළ හැක ;

(2) අවසර පත්‍රයෙන් ලැබෙන බලය අවසර පත්‍ර දරන්නාට පමණක් සීමාවේ ;

(3) ඉඩම් වෙනුවෙන් ගෙවිය යුතු බදු, අයබදු, වරිපනම් ආදී සියළුම වැය මුදල් අවසරපත්‍රකරු විසින් ගෙවිය යුතුය ;

(4) අවසරපත්‍රකරු විසින් ඉඩමේ තිබෙන මායිම් සහ මායිම් ගල් යනාදිය සුරක්ෂිතව තබා ගත යුතුවා පමණක් නොව, ඒ වෙනුවෙන් වැය වන යම් මුදලක් ඇත්නම් ඔහු විසින් දැරිය යුතුය ;

(5) දිසාපතිතුමාගේ කැමැත්ත පළමුවෙන් ලියවිල්ලකින් ලැබ මිස, අවසරපත්‍රකරු ඉඩමේ වැවෙන ගස් කැපීම හෝ කැපීමට ඉඩදීම, ඒවාට අලාභහානි කිරීම හෝ අලාභ හානි කිරීමට ඉඩ දීම නොකළ යුතුයි ;

(6) දිසාපතිතුමාගේ කැමැත්ත පළමුවෙන් ලියවිල්ලකින් ලැබ මිස, පස් හෝ බොරළු ඉවත් කිරීම නොකළ යුතුයි ;

(7) දිසාපතිතුමාගේ කැමැත්ත පළමුවෙන් ලියවිල්ලකින් ලැබ මිස, අවසරපත්‍රකරු විසින් ඉඩමේ ස්ථිර හෝ අර්ධ ස්ථිර ගොඩනැගිලි ඉදි කිරීම නොකළ යුතුය ;

(8) ඉඩම් කොමසාරිස්තුමාගේ කැමැත්ත පළමුවෙන් ලියවිල්ලකින් ලැබ මිස, මේ අවසරපත්‍රය මත බදුකරුට ලැබෙන හිමිකම් අතුරු බද්දක් පිට දීමට හෝ පැවරීමට හෝ උගස් කිරීම හෝ වෙනත් මොනම ක්‍රමයකින් හෝ අන් සතු කිරීම ඔහු විසින් නොකළ යුතුය ;

(9) අවසරපත්‍රකරු විසින් ඉඩමේ වගාව ආරක්ෂා කළ යුතුය. යම්කිසි දෙයක් නැතිවීම හෝ සොරකම් කිරීම හෝ ගින්නෙන් හෝ වෙනත් විධියකින් අලාභහානි සිදුවීමට ඉඩ තැබීම වැලැක්විය යුතු බවත් මොනම කරුණක් නිසා හෝ වන්දි ඉල්ලීමට අවසරපත්‍රකරුට මොනම අයිතියක් හෝ නොමැත ;

(10) දිසාපතිතුමා හෝ ඔහු විසින් බලය දී ඇති නිලධාරියෙකුට ඕනෑම වේලාවක ඉඩමට ඇතුල්වී එය පරීක්ෂා කිරීමට ඉඩ දිය යුතුය ;

(11) මෙම බද්ද අවසන්වීමට ප්‍රථම මුළු ඉඩම හෝ එහි යම්කිසි කොටසක් රජයට අවශ්‍ය වුවහොත් අවසරපත්‍රකරු විසින් මුළු ඉඩම හෝ එහි යම්කිසි කොටසක් ලියවිල්ලකින් මාසයක් කල් දීමෙන් පසු, මුළු ඉඩම හෝ එහි යම්කිසි කොටසක් දිසාපති තුමාට භාරදිය යුතුය. එසේ භාරගත් කොටස සඳහා ගණන් බැලූ මුදලක් ඉතිරි කාලයේ බද්ද සඳහා ඔහු විසින් ගෙවා ඇති මුදලෙන් අවසරපත්‍රකරුට ආපසු ගෙවනු ලැබේ ;

(12) අවසර පත්‍රයේ සඳහන් මොනම කොන්දේසියක් හෝ කඩ කිරීම දිසාපතිතුමාගේ නියමයන් පිට අවසර පත්‍රය වහාම අවලංගු කර ඉඩම රජය වෙනුවෙන් භාර ගැනීමට හේතුවනු පමණක් නොව, මොනම වන්දියක් හෝ නොගෙවා මේ වෙනුවෙන් තබන ලද ඇප මුදල සම්පූර්ණයෙන් හෝ කොටසක් වත් ආපසු නොගෙවීමට හේතු වනු ඇත ;

(13) ඉඩමට කරණ ලද වැඩිදියුණු කිරීම් හෝ වෙනත් මොනම කරුණක් නිසා හෝ වන්දි ඉල්ලීමට අවසරපත්‍රකරුට මොනම අයිතියක් හෝ නොමැත ;

(14) අවසරපත්‍ර කරු විසින් ඉඩමේ තිබෙන රබර් ගස්වල කිරි කැපීම නාශක ක්‍රමයට නොකළ යුතුයි ;

(15) අවසරපත්‍ර කරු විසින් රබර් පාලන ආඥාපණත යටතේ ගෙවීමට සිදුවන යම් මුදලක් වෙතොත් එය ඔහු විසින් ගෙවිය යුතුය ;

(16) අවසරපත්‍ර කරු විසින් රබර් කිරි කැපීම, නඩත්තු කිරීම, උදළුගෑම යන ආදී කෘෂිකාර්මික කටයුතු ක්‍රමානුකූලව කිරීම යනාදිය දිසාපතිතුමා සෑහීමට පත්වන අන්දමට කළ යුතුය.

කේ. ජී. ඩී. ඩී. පතිරත්න,
කළුතර දිස්ත්‍රික්කයේ දිසාපති වෙනුවට.

1965 අගෝස්තු මස 3 වැනි දින,
කළුතර දිසාපති කාර්‍යාලයේදී ය.

උපලේඛනය

ගහබඩ පත්තුව ප්‍රාදේශීය ආදායම් නිලධාරි කොට්ඨාශය

1965 අගෝස්තු මස 31 දින පෙරවරු 10 ට බුලත්සිංහල ප්‍රාදේශීය ආදායම් නිලධාරි කාර්‍යාලයේදී වෙන්දේසි කරනු ලබන ඉඩම්

| ඉඩම පිහිටි ගම සහ බදු අංකය | | ඉඩමේ පිහිටීම | ප්‍රමාණය සහ වගාව අ. රූ. ප. | | මුල් ලංසුව රු. ශ. |
|---|---|---|---|---|---|
| 1. යටගම්පිටිය—ඒඇල්/154/ඊ. | ... | අවසාන ගම් සිතියම අංක 149—කට්ටි අංක 324, 325, 329, 329ඒ, 329බී. | 2 3 4 රබර් ගස් | ... | 240 0 |

8–291—65.8.13 දින අංක 14,480 දරණ ගැසට් පත්‍රය.

---

මගේ අංකය : 4/5/1564
දිසාපති අංකය : එල්.එච්/එල්. 497.

## ආණ්ඩුවේ ඉඩම් පිළිබඳ රෙගුලාසි මාලාවේ 21 (2) වැනි රෙගුලාසි යටතේ කෙරෙන නිවේදනය

ලංකා ගමනාගමන මණ්ඩලයේ ලේකම්තැන විසින් ඩිපෝවක් සෑදීම පිණිස වවුනියා දිස්ත්‍රික්කයේ මාන්කුළම පිහිටි අක්. 1, රූඩ් 3, පර්. 0 ක් පමණ ආණ්ඩුවේ ඉඩම් කැබැල්ලක් බද්දට දෙන ලෙස ඉල්ලා ඇති බව මහාජනයාට මෙයින් දන්වමි.

මායිම් :—

උතුරට : ඇලක් සඳහා වෙන්කර ඇති රක්ෂිත ඉඩම ;
දකුණට : විදුලි සන්දේශ දෙපාර්තමේන්තුවට මුදා හැර ඇති රජයේ ඉඩම ;
නැගෙනහිරට : මහනුවර-යාපනය ප්‍රසිද්ධ මාර්ගය ;
බස්නාහිරට : රජයේ ඉඩම.

2. මේ සඳහා දීමට ඉඩම් තිබේ. මේ ඉල්ලීම පරිදි පහත සඳහන් කොන්දේසි සහ අනිකුත් කොන්දේසිවලට යටත් කොට ඉඩම් කැබැල්ලක් දීමට රජය අදහස් කරයි.

කොන්දේසි :—

(අ) කාලය : අවුරුදු 30 යි ;
(ආ) බද්ද : අවුරුද්දට රුපියල් 40 යි ;
(ඇ) බදුකරු විසින් බද්ද ආරම්භ වන දිනයේ පටන් අවුරුද්දක් ඇතුලත මේ ඉඩමේ ඩිපෝවක් වවුනියාවේ රජයේ දිසාපතිතුමාගේ සිත් ගන්නා පරිදි ඉදි කළයුතුය ;
(ඈ) බදුකරු විසින් මේ ඉඩම ඩිපෝවකට හැර අන් කිසි කටයුත්තක් සඳහා නොයෙදවිය යුතුයි.

3. මෙහි සඳහන් දිනයේ පටන් සති හයක් ඇතුලතදී ඉඩම් කැබැල්ල නොදිය යුතු බවට සෑහෙන හේතුන් ලියා මාවෙත ඉදිරිපත් නොකළ හොත් මේ ඉල්ලීම අනුව ඉඩම බදු දෙන්නෙමි.

ඊ. කේ. ආර්. අසරප්පා,
ඉඩම් කොමසාරිස් වෙනුවට.

1965 අගෝස්තු මස 13 වැනි දින,
කොළඹ දී ය.

8–339—65.8.13 දින අංක 14,480 දරණ ගැසට් පත්‍රය.

---

## මැණික් ගැරීමේ අයිතිය වෙන්දේසියේ විකිණීම

රත්නපුර දිස්ත්‍රික්කයේ දිසාපතිතුමා විසින් පහත දැක්වෙන උපලේඛනයේ විස්තර කර තිබෙන රජයේ ඉඩම්වල මැණික් ගැරීමේ අයිතිය මසකට බදුදීම පිණිස ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

2. 1965 අගෝස්තු මස 30 වැනි දින පෙරවරු 10ට එම ඉඩමේ දී ම මෙම වෙන්දේසිය ආරම්භ කරනු ලැබේ.

3. වෙන්දේසියේ දී බිම් කට්ටි ඉල්ලුම් කිරීමට අදහස් කරන අයවලුන් විසින් තම ඉල්ලීම පිළිගනු ලැබුවහොත් තමා විසින් ඉල්ලුම් කරන ලද මුදල් සම්පූර්ණයෙන් එම අවස්ථාවේදීම ගෙවීමට සූදානම්ව පැමිණිය යුතුයි.

4. වෙන්දේසියේදී ඉඩම ලබාගත් අය ඉහළම ලන්සුව වහාම ගෙවිය යුතුවන අතර අතිරේකව තැන්පත් මුදල වශයෙන් රුපියල් 500 ක් බැඳිය යුතුයි. එම මුදල සඳහා කුවිතාන්සියක් ලබාගෙන බදු බලපත්‍රයකට ඇතුලත්විය යුතුයි. මැණික් ගැරීමේදී කණිනු ලබන වළවල් ඇඳිය ගොඩකිරීම සඳහාත්, බදු ඔප්පුවේ සඳහන් කොන්දේසි හරියාකාර පිළිපැදීම සඳහාත් එම ඇපය තැන්පත් කළ යුතුයි. බදු ඔප්පුවේ කොන්දේසි හරියාකාර පිළිපැද කණින ලද වළවල්ද නිසි ආකාර ගොඩකළ පසු තැන්පත් කරන ලද ඇප මුදල ආපසු ගෙවනු ලැබේ.

5. ඉඩම් ලබාගත් අයවලුන්ට ඉඩමේ භුක්තිය භාරදෙනු ලබන දිනය වෙන්දේසිය අවසානයේදී දැනුම් දෙනු ලැබේ.

6. බදු ගත් කාලසීමාව තුළදී ඉඩමේ පිහිටි ගස් කොළන් ආදිය කපා, උදුරා හෝ වෙනත් අන්දමකින් අලාභ හානියක් සිදුකළහොත් ඒ සඳහා වන්දි මුදල් ගෙවීමට ගැනුම්කරුට සිදුවේ.

7. බදු ගැණුම්කරු විසින් ඉඩමේ පතල් කැපීම ආරම්භ කිරීමට පෙර ඒ බව භූ විද්‍යා සමීක්ෂණ අධ්‍යක්ෂ වෙත ලියාපදිංචි කරන ලද තැපැලෙන් දන්වා යැවිය යුතුයි. ඔහුගේ ලිපිනය—භූ විද්‍යා සමීක්ෂණ අධ්‍යක්ෂක, භූ විද්‍යා සමීක්ෂණ දෙපාර්තමේන්තුව, කොළඹ 2 ය. උවමනා අවස්ථාවකදී එම නිලධාරිතුමාට මැණික් ගැරීමේ වැඩ කටයුතු පරීක්ෂා කර බැලීමට ඉඩදිය යුතුයි.

8. ඉඩම් විකුණනු ලැබූ පසු එය රජයේ උවමනාවන්ට අවශ්‍යවී තිබී වැරදීමකින් හෝ නැතහොත් වෙන යම් කරුණක් නිසා විකුණනු ලැබූ බව වැටහුනොත් දිසාපතිතුමා විසින් බදු බලපත්‍රය අවලංගු කරනු ලැබේ. එසේ කිරීමේදී ගැනුම්කරුට තැන්පත් මුදල ආපසු ගෙවනු ලැබේ. වෙනත් අලාභයක් හෝ ආධාරයක් නැතහොත් වන්දි මුදලක් වශයෙන් යම්කිසි මුදලක් ගෙවනු නොලැබේ.

9. ඉඩම්වල මැණික් ඇති බවට වගකියනු නොලැබේ.

10. මේ පිළිබඳව වැඩි විස්තර රත්නපුර දිස්ත්‍රික්කයේ දිසාපතිතුමාගෙන් ලබාගත හැක.

වි. ර. බ. රාජකරුණා,
රත්නපුර දිස්ත්‍රික්කයේ දිසාපති වෙනුවට.

1965 අගෝස්තු මස 7 වැනි දින,
රත්නපුර දිසාපති කාර්යාලයේ දීය.

### වෙන්දේසි කිරීමට බලාපොරොත්තුවන ඉඩම්වල විස්තර

කුරුවිට කෝරළේ උඩපත්තුවේ අංක 342 දරණ අ. ග. සිතියමේ හැදැල්ලන යන ගමේ ලොට් අංක 155 හේ කොටසක් වන හිදැල්ලන-කරපිංච ප්‍රසිද්ධ පාරේ දිගින් අඩි 70 ක් වූ ප්‍රමාණය ඇතුලත බිම් කට්ටි 3ක මායිම් :—

උතුරට : ඉ. ස. ආ. යටතේ දී ඇති ඉඩමේ කම්බිවැට ;
දකුණට : වාරිමාර්ග දෙපාර්තමේන්තු නිවසේ කම්බි වැට ;
නැගෙනහිරට : වාරිමාර්ග දෙපාර්තමේන්තු නිවසට හැරෙන පාර ;
බටහිරට : එම පාරේ 3 වැනි බෝක්කුවට අඩි 20ක් නැගෙනහිරින්.

8–412—65.8.13 දින අංක 14,480 දරණ ගැසට් පත්‍රය.

සෑම සිකුරාදා දිනයකම ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය පළ කරනු ලැබේ. ප්‍රසිද්ධ නිවාඩු දින අතරට පැමිණෙන සෑම සතියකදීම පළ කරන දිනය වෙනස් වීමට ඉඩ තිබේ.

ගැසට් පත්‍රය පළ කරන දින සිට කාර්යාලය වැඩ කරන දින හතරකට ප්‍රථම පස්වරු 3.30 ට සියලුම දැන්වීම් සහ ප්‍රකාශනයන් කොළඹ, රජයේ මුද්‍රණාලයේ මුද්‍රණාලයාධිපති තැනට ලැබෙන සේ එවිය යුතුයි (සාමාන්‍ය වශයෙන් සඳුදා පස්වරු 3.30 ට ප්‍රථමයෙන්).

ගැසට් පත්‍රය ලබාගැනීම සඳහා දායක මුදල් කොළඹ, මහලේකම් කාර්යාල ගොඩනැගිල්ලේ පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරි වෙත කෙළින්ම ගෙවිය යුතුය. ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති විසින් දායක මුදල් භාරගනු නොලැබේ.

ලංකාවේ වාලච්චේනයෙහි පිහිටි "ඊස්ටර්න් පේපර් මිල්ස් කෝපරේෂන්" හි නිපදවන ලද කඩදාසිවල
ලංකාණ්ඩුවේ මුද්‍රණාලයේ මුද්‍රාපිතයි